සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

**7 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ,
    (1) තම බලය අනුව (2) තම ශක්තිය අනුව
    (3) තම මැවිල්ල අනුව (4) තම ස්වරූපය අනුව

02. පස්වන පනත වන්නේ,
    (1) ජීවිත විනාශ නොකරන්න. (2) ඉරු දින ශුද්ධ ලෙස ගතකරන්න.
    (3) පිරිසිදු පැවැත්මෙන් ජීවත් වන්න. (4) සොරකම් නොකරන්න.

03. ''.......... ඔබේ ............... කීකරු වන්න. එය ක්‍රිස්තියානි යුතුකමකි.'' හිස්තැන්වලට සුදුසු වචන වන්නේ,
    (1) ළමයිනි, වැඩිහිටියන්ට (2) දරුවෙනි, දෙමාපියන්ට
    (3) ළමයිනි, ගුරුවරුන්ට (4) ගුරුවරුනි, දෙමාපියන්ට

04. විශ්වාස ලක්ෂණයේ ධර්මතා ගණන වන්නේ,
    (1) 14 කි. (2) 12 කි. (3) 15 කි. (4) 16 කි.

05. පූජකවරය බෙදී ඇති කොටස් ගණන වන්නේ කීයද?
    (1) දෙකකි. (2) හතරකි. (3) තුනකි. (4) පහකි.

06. ආදි මව්පියන් කළ පළමු වරද හඳුන්වන්නේ ..................... නමිනි.
    (1) ජන්ම පාපය (2) මරණීය පාපය (3) සුලු පාපය (4) මහා පාපය

07. ජපමාල මංගල්‍යය පවත්වනු ලබන්නේ කවදාද?
    (1) දෙසැම්බර් 01 (2) අගෝස්තු 08 (3) ඔක්තෝබර් 07 (4) ජනවාරි 08

08. අපට සදාතන ජීවිතය අහිමි වූයේ ................. නිසාය.
    (1) වෛරය (2) ක්‍රෝධය (3) පාපය (4) ආදරය

09. අප සතු ප්‍රධාන වගකීමකි,
    (1) සියලු දෙනාම සතුටු වනසේ හැසිරීම
    (2) අපගේ මව්බිමට ගෞරව කිරීම හා සේවය
    (3) ඉගෙනගෙන උසස් රැකියාවක් කිරීම
    (4) අනාගතයේ වාසනාවන්ත ජීවිතයක් ගත කිරීම

10. දෙවියන් වහන්සේට හිමි උත්තරීතර නමස්කාරය ඔවුන් වහන්සේට පුද කරන්නේ,
    (1) දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව තුළිනි. (2) දේවස්ථානයේ මංගල්‍යය තුළිනි.
    (3) දිව්‍ය පූජා යාගය තුළිනි. (4) ශුද්ධ වූ පැය තුළිනි.

11. ''පියාණෙනි, මේ කුසලාන මාගෙන් ඉවත් කළ මැනව. එහෙත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත සිදුවේවා.'' යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,

(1) උඩුමහල් මැඳුරේදී (2) ජොර්දාන් ගඟ අසලදී

(3) කුරුස ගසේ දී (4) ගෙත්සමෙහි උයනේ දී

12. මිනිසා ආත්මාර්ථකාමී ලෙස සොබා දහම විනාශ කරමින් වාසි ලබා ගැනීමට යාමේ අවසාන ප්‍රතිඵලය වන්නේ,

(1) බාල පරපුරට සොබා දහම නැතිවී යාමයි.

(2) සොබා දහම සතුන්ට අහිමි වී යාමයි.

(3) මිනිසාම විනාශයට පත්වීමයි.

(4) සොබා දහමේ වටිනාකම දිනෙන් දින අඩු වී යාමයි.

13. ''ඉල්ලන්න ඔබට ලැබේ. සොයන්න, ඔබට සම්බ වේ......... ''

හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) තට්ටුකරන්න, ඔබට දොර හරිනු ලැබේ.

(2) දොර අරින්න, ඔබට අවශ්‍ය දේ දෙනු ලැබේ.

(3) බලා සිටින්න, ඔබේ බලාපොරොත්තුව ඉටුවේ.

(4) වෙහෙස වන්න, ඔබට ප්‍රතිඵල ලැබේ.

14. මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි. මාගේ සිත මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි යනුවෙන් දෙවියන් වහන්සේට ප්‍රශංසා ගීයක් ගායනා කළේ,

(1) සකරියස්තුමා (2) මෝසෙස්තුමා (3) සිමියොන්තුමා (4) මරියතුමී

15. කිතුනුවන් වන අපගේ ආධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීම සඳහා ........... අත්‍යාවශ්‍ය අංගයකි,

(1) යාච්ඤාව (2) ඉවසීම (3) බෙදා ගැනීම (4) සමාව දීම

16. ආබ්‍රහම්ගේ බිරිඳ වන්නේ ...................... ය.

(1) නයෝමි (2) රාකෙල් (3) සාරා (4) එළිසබෙත්

17. ජේසුස් වහන්සේ කුරුස ගසේදී දකුණු පස සිටි වරදකරුවා කළ ඉල්ලීම වන්නේ,

(1) ඔබත් ගැලවී අපත් ගලවා ගත මැනව.

(2) ජේසුස් වහන්ස, ඔබට හැකිනම් මා නිදහස් කළ මැනව.

(3) ජේසුස් වහන්ස, අප ගලවා ගන්නා ලෙස පියාණන්වහන්සේට යාච්ඤා කළ මැනව.

(4) ජේසුස් වහන්ස, ඔබ රාජශ්‍රීයෙන් වඩනා කල මා සිහි කළ මැනව.

18. මෙතැනට ළං නොවන්න. නුඹේ පාදවලින් වහන් ගලවා දමන්න. නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියකි. දෙවියන් වහන්සේ මෙසේ වදාළේ,

(1) මෝසෙස්ට (2) ජාකොබ්ට (3) දාවිත්ට (4) සාවුල්ට

19. ග්‍රීසියේ ඇතන්ස්හි වැසියන්ට දෙවියන් වහන්සේව හඳුන්වා දුන්නේ,

(1) ශුද්ධ වූ පේදුරුතුමා (2) ශුද්ධ වූ පාවුලුතුමා

(3) ශුද්ධ වූ ස්තේපත්තුමා (4) ශුද්ධ වූ පිලිප්තුමා

e-thaksalawa The National e-learning Portal for the General Education

20. මාංශ ගත වීමේ අභිරහස යනු,

(1) දේව පුත්‍රයා මරියතුමියගේ කුසෙහි පිළිසිඳ ගැනීමයි.

(2) ජේසුස් වහන්සේගේ උත්ථානයයි.

(3) ජේසුස් වහන්සේගේ කළ ප්‍රාතිහාර්යයන්ය.

(4) ජේසුස් වහන්සේ දේව මාලිගයේ නැතිවීමයි.

- **වරහන් තුළින් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.**

21. ලෝකාරම්භයේදී ම .................................................................................. විවාහය ස්ථාපිත කළ සේක.

22. ලෝකය වැඩි දියුණු කිරීමට දෙවියන් වහන්සේ ............................................................ පැවරූ සේක.

23. සියලු මැවිලි ......................................................................................................................... ය.

24. ඔබ ශුද්ධාත්ම මාලිගයක් බවට පත් වූයේ ............................................................................ ලැබූ දා.

25. ශුද්ධාත්ම දානය ලැබූ මුල්ම පිරිස වන්නේ ............................................................................... කි.

26. අප .................................................................................................... කළ යුත්තේ දෙවිඳුන්ට පමණි.

27. ශුද්ධ වූ සභාවේ දෘෂ්‍යමාන නායකයා වන්නේ ..............................................................................

28. ජුදා සංස්කෘතියට අනුව සිහිකිරීම යනු ............................................................................................

29. මෙඩියස් යනු .............................................................................................................................

30. පූජක වරය කොටස් ...................................................................................................................... කි.

(120 / වන්දනා / දෙවියන් වහන්සේ / මනහර / නැවත සිදු කිරීම / දෙකකි / ප්‍රසාද ස්නාපනය / 1 වන ප්‍රැන්සිස් / මිනිසාට / අභිශේක කරනු ලැබූ තැනැත්තා)

- **ප්‍රශ්න අංක 31 - 35 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

31. නිතර නිතර යාච්ඤා කිරීම සුදුසු නැත. ( )

32. මෙතැනට ළංනොවන්න. පාදවලින් වහන් ගලවන්න කීවේ ආබ්‍රහම්ටය. ( )

33. ජේසුතුමා රෝගීන් සුව කළ සේක. ( )

34. දයාවේ මාතාව මරිය තුමියයි. ( )

35. හතරවන පනත මව්පියන්ට ගෞරව කරන්න යන්නයි. ( )

- **ගැලපෙන සේ යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 36. | ජේසුතුමාව පරීක්ෂා කළේ | 1 | හතකි |
| 37. | අද ඔබ මා සමඟ පාරාදීසයෙහිය | 2 | ශුද්ධාත්මයාණෝය |
| 38. | ශුද්ධාත්ම දීමනා | 3 | තුනකි |
| 39. | සහනදායකයාණෝ යනු | 4 | යක්ෂයා |
| 40. | අප දැනගත යුතු ප්‍රධාන ධර්මතා ගණන | 5 | දකුණු පස වැරදිකරුවා |

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) (1) අප පොදුවේ කියන යාච්ඤා 03 ක් නම් කරන්න.

(2) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 02 ක් නම් කරන්න.

(3) ඔබ යාච්ඤා කරන අවස්ථා 04 ක් ලියන්න.

(4) යාච්ඤාවක් යනු කුමක් ද?

(5) ඔබේ ඉගෙනීම සාර්ථක කර ගැනීමට දෙව් පියාණන්ගෙන් පිහිට ඉල්ලා යාච්ඤාවක් නිර්මාණය කරන්න.

(02) (1) සාර ධර්මයක් යනු කුමක් ද?

(2) අප රටේ පවතින සාරධර්ම 05 ක් ලියන්න.

(3) ඔබේ සහෝදර සහෝදරියන් ගොඩනඟා ගත යුතු සාරධර්ම 04 ක් ලියා දක්වන්න.

(03) (1) අප ඉරු දින දිව්‍ය පූජාවට අර්ථවත් ලෙස සහභාගී වන්නේ කෙසේද? ආකාර 03 ක් ලියන්න.

(2) දෙව් පියාට ගෞරවය හිමි වන ආකාරයෙන් ජීවත් වීමට අප කළයුතු දේවල් 04 ක් ලියන්න.

(04) (1) උත්තම පූජක යාච්ඤාව තුළින් ජේසුස් වහන්සේ දෙව් පියාණන් ගෙන් කළ ඉල්ලීම් තුන ලියන්න.

(2) කිතුණු දරුවන් ලෙස අප දෙව් පියාණන්ගෙන් ඉල්ලා සිටිය යුතු දේවල් 04 ක් ලියන්න.

(05) (1) දස පනතේ තුන්වන පනත ලියා දක්වන්න.

(2) ඉරුදින ශුද්ධ ලෙස ගත කළ හැකි ආකාර 05 ක් ලියන්න.

(3) සැම ඉරුදිනකම රැකියා කරන කෙනෙකුට ඔබ දෙන උපදෙස් 03 ක් ලියා දක්වන්න.

(06) (1) දේව වන්දනාවට පටහැනි ක්‍රියා මොනවා ද?

(2) අප වන්දනා කළ යුත්තේ කාටද?

(3) ජන වන්දනා වර්ෂයට අයත් කාල සීමාවන් 05 නම් කරන්න.